

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 79

உயர்நீதிமன்ற நீதியரசர்கள்

Parliamentary Series No :79

Judges of the Superior Court

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

ආයතනයේ නම : උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 79

நிறுவனத்தின் பெயர்: உயர்நீதிமன்ற நீதியரசர்கள்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 79

Name of the Institution : Judges of the Superior Courts

Submission of observations of the Hon.Minister in Charge of the Institutions and steps taken With regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No . 119(4)

<u>පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 79</u>

<u>ආයතනයේ නම - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු</u>

<u>2022 මුදල් වර්ෂය- පළමු කොටස</u>

	කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා	දුර්වලතා මග හරවා ගැනීම සඳහා ආයතනය මගින් ගත් පියවර/වර්තමාන තත්ත්වය
01	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	විගණන ඒකකයක් නොමැති බැවින් අවදානම් ලේඛනයක් සකස් නොකරයි.
02	වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇත. එමෙන්ම 2023 හා 2024 සඳහා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රමවත්ව පිළියෙල කර ඇත.
03	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ අවසන් කර වාර්තාව නිසි පරිදි ඉදිරිපත් කර ඇත. 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කර මු.රෙ.756(6) ප්‍රකාරව වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.
04	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා වාහන 37 ක් යොදවා ඇති අතර එයින් 24ක් උපරිමාධිකරණ විනිසුරුවරුන් යන ශීර්ෂය යටතේ පවතින අතර අනෙකුත් වාහන අධිකරණ අමාත්‍යාංශය හා නීතිපති දෙපාර්තමේන්තුව යටතේ පවතී.එම වාහන වල අයිතිය තහවුරු කිරීම සඳහා ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇති නමුත් මේවන තෙක් අයිතිය තහවුරු කරන ලිපි ලැබී නොමැත.
05	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	උපරිමාධිකරණ විනිසුරුවරුන් යන ශීර්ෂය යටතේ පවතින සෑම වාහනයක් සඳහාම ලොග් පොත් පවත්වාගෙන යනු ලබන අතර එම පොත් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. අධිකරණ අමාත්‍යාංශය හා නීතිපති දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන සඳහාද ලොග් පොත් පවත්වාගෙන යාම සඳහා මේ වන විට පියවර ගෙන ඇත.
06	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතු රු අග්‍රිම කාර්ය නිමවී සතියක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මේ වන විට නිලධාරීන් දැනුවත් කර ඇති අතර, ඒ සඳහා අභ්‍යන්තර උපදෙස් මාලාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
07	වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි.	2022 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව 2023.07.28 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.2023 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවද මේ වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.
08	කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාවරුන් සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාවරුන් පත් කර අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබයි.ඒ අනුව නැවත ලිඛිත කාර්ය පැවරීමක් අවශ්‍ය නොවේ.

09	2017.09.20 දැනැති අංක 04/2014 දරන කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කාර්යමණ්ඩල තොරතුරු කාර්තුවක් අවසන් වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	අදාල නොවේ.(පත්වීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නියම කර ඇත.)
10	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අභ්‍යන්තර විගණන විමසුම් නොමැත.
11	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තා නොමැත.
12	මු.රෙ. 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තා නොමැත.
13	මු. රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදි පිළියෙල කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන අංශයක් නොමැත.

07.08.2024 වන දින,
ශ්‍රේෂ්ඨාධිකරණයේදීය.

රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය

අරවින්ද ගුණරත්න
අතිරේක මහේස්ත්‍රාත්
රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12.

<u>පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 79</u>

<u>ආයතනයේ නම - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු</u>

<u>2022 මුදල් වර්ෂය-</u> දෙවන කොටස

	කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා	දුර්වලතා මග හරවා ගැනීම සඳහා ආයතනය මගින් ගත් පියවර/වර්තමාන තත්ත්වය
01	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	1.6 ඡේදයට යටත්ව මතයක් ප්‍රකාශ කර ඇත.2023 වර්ෂයේද යටත්ව මට්ටමේ මතයක් ප්‍රකාශ කර ඇත.
02	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා අදාල නොවේ.
03	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා අදාල නොවේ.
04	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා අදාල නොවේ.
05	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා අදාල නොවේ.
06	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් තිරසර අරමුණු හඳුනාගැනීම සිදු කරනු ලබයි. 2024 වර්ෂය සඳහාද තිරසර අරමුණු හඳුනාගෙන ඇත.
07	හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කරයි.2024 වසර සඳහාද යාවත්කාලීන කර ඇත.
08	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කරයි.
09	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා අදාල නොවේ.
10	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉදිරිපත් කර තිබූ සියලු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති අතර හැකි සෑම නිර්දේශයක්ම මේ වන විට ක්‍රියාත්මක කර ඇත.

11	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මගින් කාර්ය සාධන දර්ශක හඳුනාගැනීම සිදුකරයි. 2024 වසර සඳහාද යාවත්කාලීන කර ඇත.
12	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන්ලාහට ස්ථාන මාරුවීම් නොමැත.

07.08.2024 වන දින,
ශ්‍රේෂ්ඨාධිකරණයේදීය.

රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය

අරවින්ද ගුණරත්න
අතිරේක මහේස්ත්‍රාත්
රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12.